# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,927 - 2015 අගෝස්තු මස 07 වැනි සිකුරාදා - 2015.08.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1314 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1318 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1325 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1328 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අගෝස්තු මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අගෝස්තු මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය* *www. documents.gov. lk* *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

**මහාධිකරණය - මොණරාගල**

රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මොණරාගල ඌව පළාත්බද මහාධිකරණයේ පවරන ලද දනට අවසන් වී ඇති පහත විස්තර සඳහන් භාණ්ඩ පහත කොන්දේසිවලට යටත්ව 2015.09.01 වැනි දින පෙ. ව. 9.30 ට මෙම අධිකරණයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට ප්‍රථම මහජනතාවට නඩු භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැකි ය.

02. තක්සේරු මිලට ඉල්ලීමක් ඉදිරිපත් නොවන ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත් කිරීමට අධිකරණයට බලය ඇත.

03. වෙන්දේසිය පවත්වන දින ප. ව. 4.00 ට පෙර අදළ මුදල් ගෙවා අධිකරණ සංකීර්ණයෙන් භාණ්ඩ ඉවත් කර ගත යුතු ය. ගෙවීම් සඳහා චෙක්පත් භාරගනු නොලැබේ.

04. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගන්නන් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වෙනත් හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

05. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කර වෙන්දේසියෙන් ඉවත්කර ගත යුතු ය.

06 අධිකරණය විසින් නියම කරන ලද අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ සම්පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

ඒ. කේ. එම්. පටබැඳිගේ,
මහාධිකරණ විනිසුරු.

2015 ජූලි මස 15 වැනි දින,
මොණරාගල ඌව පළාත්බද මහාධිකරණයේ දී ය.

| | නඩු අංකය | නඩු භාණ්ඩ |
|---|---|---|
| 01. | 14/2008/අපරාධ | පාපැදිය |
| 02. | 73/2008/අපරාධ | පාපැදිය |
| 03. | 166/2008/අපරාධ | පාපැදි 02 |
| 04. | 474/2008/අපරාධ | GA - 5569 දරන හොණ්ඩා 125 යතුරු පැදිය (ලි. ප. කළ හැක) |
| 05. | 155/2013/අපරාධ | MO - 5453 අංක දරන රනෝමොටෝ යතුරු පැදිය (අමතර කොටස් සඳහා ලියාපදිංචි කළ නොහැක) |
| 06. | 157/2013/අපරාධ | SPUM-4103 අංක දරන බජාජ් XCD යතුරුපැදිය (ලි. ප. කළ හැක) |
| 07. | 115/2014/අපරාධ | MD2DSPA2ZSWM 20120 - JBMBSM89512 බජාජ් ඩිස්කවරි යතුරු පැදිය (අමතර කොටස් සඳහා ලියාපදිංචි කළ නොහැක) |
| 08. | 166/2013/අපරාධ | හෙල්මට් 01 HA-0425 අංක දරන බජාජ් බොක්සර්/යතුරුපැදිය (ලියාපදිංචි කළ හැකිය) |
| 09. | 124/2013/අපරාධ | LB-4058 අංක දරන හයි උන්ඩායි ලොරි රථය (අමතර කොටස් සඳහා ලියාපදිංචි කළ නොහැක) |
| 10. | 35/2008/අපරාධ | වළලු 01යි, මුදු 04යි, කරාබු 06යි |
| 11. | 15/2009/අපරාධ | ටූසල් ජෝඩු 01, මුදු 01 |
| 12. | 09/2009/අපරාධ | කරාබු ජෝඩු 01 |
| 13. | 22/2013/අපරාධ | මුදු 01 |
| 14. | 327/2008/අපරාධ | සුදු යකඩ මුදු 02 |
| 15. | 79/2013/අපරාධ | නොකියා ජංගම දුරකථන 03 |
| 16. | 57/2014/අපරාධ | නොකියා ජංගම දුරකථන 01 |
| 17. | 102/2014/අපරාධ | AG - TEL රතු ජංගම දුරකථනය |
| 18. | 114/2014/අපරාධ | නොකියා ජංගම දුරකථන 01 |
| 19. | 111/2008/අපරාධ | කැති 01 |
| 20. | 113/2008/අපරාධ | කැති 01 |
| 21. | 222/2008/අපරාධ | කැති 02 |
| 22. | 248/2008/අපරාධ | කැති 02 |
| 23. | 516/2008/අපරාධ | කැති 01 |
| 24. | 133/2013/අපරාධ | කැති 01 |
| 25. | 160/2013/අපරාධ | කැති 01 |
| 26. | 50/2014/අපරාධ | කැති 01 |
| 27. | 164/2013/අපරාධ | පොරව 01 |
| 28. | 393/2008/අපරාධ | පොරව 01 |
| 29. | 66/2008/අපරාධ | අත් පොරව 01 |
| 30. | 14/2012/අපරාධ | පොරව 01 |
| 31. | 138/2008/අපරාධ | පිත්තල උණ්ඩ කොපු 01 |
| 32. | 307/2008/අපරාධ | පී. වී. සී. බට 02 |
| 33. | 395/2008/අපරාධ | ඇලුමිනියම් කල්දේරම් 01 |
| 34. | 23/2012/අපරාධ | රතු යකඩ බට 01 |
| 35. | 103/2014/අපරාධ | නිල් පාට කුඩ බෑග් 01 |
| 36. | 13/2015/අපරාධ | ආර්පිකෝ වතුරු ටැංකි 01 (ලී. 1000) |
| 37. | 140/2008/අපරාධ | පිහි 01 |
| 38. | 154/2008/අපරාධ | මේස පිහි 02 |
| 39. | 222/2008/අපරාධ | මන්නා පිහි 01 |
| 40. | 555/2008/අපරාධ | මේස පිහි 01 |
| 41. | 80/2010/අපරාධ | වක් පිහි 01 |
| 42. | 14/2012/අපරාධ | පිහි 01 |
| 43. | 147/2013/අපරාධ | පිහි 01 |
| 44. | 160/2013/අපරාධ | මන්නා පිහි 01 |
| 45. | 21/2014/අපරාධ | සුදු යකඩ පිහි 01 |
| 46. | 52/2014/අපරාධ | පිහි 01 |
| 47. | 53/2014/අපරාධ | පිහි 02 |
| 48. | 87/2014/අපරාධ | කුඩා පිහි 01 |
| 49 | 102/2014/අපරාධ | උක් කපන පිහි 01 |
| 50. | 344/2008/අපරාධ | උදලු 03 |
| 51. | 44/2012/අපරාධ | උදලු 01 |
| 52. | 391/2008/අපරාධ | උදල්ල |
| 53. | 385/2008/අපරාධ | අලවංගු 01 |
| 54. | 514/2008/අපරාධ | අලවංගු 01 |
| 55. | 344/2008/අපරාධ | අලවංගු 01 |
| 56. | 50/2012/අපරාධ | යකඩ කුරු 01 |
| 57. | 133/2013/අපරාධ | යකඩ බට 01 |

| | | |
|---|---|---|
| 58. | 38/2012/අපරාධ | හෙල්මට් 02 |
| 59. | 33/2011/අපරාධ | නයිලෝන් ලණු කැබලි 02 |
| 60. | 22/2013/අපරාධ | ඔරලෝසු 01 |
| 61. | අඩි 2 1/2ක් පළල, අඩි 06ක් උස කාර්යාලයෙන් ඉවත් කරන ලද දොර | |
| 62. | අබලන් වූ බිත්ති ඔරලෝසු 02ක් | |

08-09

---

## බස්නාහිර පළාත්බද මහාධිකරණය - පානදුර

පානදුර මහාධිකරණයේ නඩුවලට අදළව රාජසන්තක කරන ලද සහ අයිතිවාසිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2015.10.07 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර, ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව සළකා බැලීම සඳහා අදළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා ගෙන වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පමණ පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ භාර ගැනීමේ දී සහ මුදල් ගෙවීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, භාණ්ඩ මිලදී ගැනීමට එන සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය වේ.

06. සියළුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, මිලදී ගන්නා භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේ ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

එච්. එම්. අමල් තිලකරත්න,
බස්නාහිර පළාතේ මහාධිකරණ විනිසුරු.

2015 ජූලි මස 14 වැනි දින,
පානදුර මහාධිකරණයේ දී ය.

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01. | 3059/13 | මධ්‍යම සැකසුම් ඒකකය (A zzura M 1000)<br>Epson 13 වර්ගයේ ප්‍රින්ටර් 03<br>යතුරු පුවරු 01<br>මොනිටර් 01<br>U S B කේබල් 03<br>පරිගණක පවර් කෝඩ් 01<br>පවර් කනෙක්ටර්ස් 02<br>පරිගණක මවුස් 02<br>ප්‍රින්ටර් කේබල් 03<br>නිල්/කහ/රතු Epson (73 N) වර්ගයේ පාවිච්චි නොකරන ලද කාට්‍රිට් 12<br>නිල්/කහ/රතු Epson (73 N) වර්ගයේ පාවිච්චි නොකරන ලද කාට්‍රිට් 41<br>Epson (CP) වර්ගයේ කාට්‍රිට් 12<br>මල්ටි ප්ලග් 01<br>ස්ක්‍රීන් බෝඩ් 02<br>පේපර් කටර් පිහිතල 10<br>පිහි ඇසුරුම් 01<br>නියන් 03<br>අඩි රූල් 01<br>කතුරු 01<br>Sony Erisson වර්ගයේ ජංගම දුරකථනය<br>ස්ටෙප්ලර් 01 |
| 02. | 2946/13 | නොකියා ජංගම දුරකථනය |
| 03. | 2199/06 | පොරවක් |
| 04. | 3028/13 | නොකියා ජංගම දුරකථන 01ක් |
| 05. | 2567/09 | මෝටරෝලා ජංගම දුරකථනය |
| 06. | 2122/06 | උදල්ලක්<br>අලවංගුවක්<br>රන් දන්වැල් කෑල්ලක් |
| 07. | 2989/13 | නොකියා ජංගම දුරකථනයක් |
| 08. | 2497/08 | මිටියක් |
| 09. | 2935/12 | නොකියා ජංගම දුරකථනය |
| 10. | 2961/13 | ජංගම දුරකථනයක් |
| 11. | 2428/07 | පොරවක් |
| 12. | 3110/14 | WP - MJ 2552 දරන Loncin වර්ගයේ යතුරුපැදිය |
| 13. | 3051/13 | SP - TA - 9741 බජාජ් ඩිස්කවරි වර්ගයේ යතුරුපැදිය |
| 14. | 2931/12 | 153 - 2502 යමහා වර්ගයේ යතුරුපැදිය |
| 15. | 2961/12 | 144-9280 සුසුකි වර්ගයේ යතුරුපැදිය හා හිස්වැසුම් 01 |
| 16. | 3166/14 | WP - TV 3066 බජාජ් වර්ගයේ යතුරුපැදිය |
| 17. | 2994/13 | WPVE - 6674 Kinetic වර්ගයේ යතුරුපැදිය |
| 18. | 3079/14 | SP - VI - 0464 බජාජ් වර්ගයේ යතුරුපැදිය |
| 19. | 3106/14 | WP - JT 0498 බජාජ් වර්ගයේ යතුරුපැදිය හා හිස්වැසුම් දෙක |
| 20. | 2391/07 | WP - JI - 7637 බජාජ් වර්ගයේ අබලන් ත්‍රිරෝද රථය (අමතර කොටස් ලෙස) |
| 21. | 2052/05 | Nokia ජංගම දුරකථනය |
| 22. | නඩු අංකය රහිත | Alfatel ජංගම දුරකථනය |
| 23. | නඩු අංකය රහිත | Nokia ජංගම දුරකථනය |
| 24. | 3076/14 | WPHO - 0403 දරන ත්‍රිරෝද රථය (අමතර කොටස් ලෙස) |
| 25. | 3195/15 | WPVS - 8084 ඩිස්කවරි යතුරුපැදිය |
| 26. | 3145/14 | WPMH - 5671 හීරෝ හොණ්ඩා යතුරුපැදිය |
| 27. | 3045/13 | Nokia ජංගම දුරකථනය |
| 28. | පැරණි ගැසට් තොගයක් | |

08-21

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - හම්බන්තොට

මෙම අධිකරණය විසින් රාජසන්තක කරන ලද හෝ නියමිත දිනට හිමිකම් නොපෑ භාණ්ඩ පිළිබඳ වෙන්දේසියක් 2015.09.05 දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී පැවැත්වෙන බව මෙයින් සියලු දෙනාටම දැනුම් දෙනු ලැබේ.

මෙම භාණ්ඩ මිලදී ගනු ලබන අවස්ථාවේ දී නියමිත මුදල් ගෙවා රිසිට්පතක් ලබාගත යුතු ය. චෙක්පත්, මුදල් ඇනවුම් භාරගනු නොලබන අතර මිලට ගන්නා භාණ්ඩ එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

මෙහි සඳහන් භාණ්ඩ පිළිබඳව හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසියේ දිනට පෙර දින තම හිමිකම් ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වනු ලැබේ.

රෙජිස්ට්‍රාර්වරයාගේ අධීක්ෂණය පිට එදින පෙ. ව. 9.00 - 9.45 දක්වා භාණ්ඩ පරීක්ෂා කර බැලීමට ඉඩදෙනු ලැබේ.

අධිකරණය විසින් නියම කරනු ලබන ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරගනු ලැබේ.

වෙන්දේසියේ බඩුමිලදී ගැනීම සඳහා පැමිණෙන සෑම අයෙක් ම තමාගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු ය.

දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්.

2015 ජූලි මස 06 වැනි දින,
හම්බන්තොට දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 92892 | අංක spuy -6457 දරන යතුරුපැදිය | 01 |
| 02. | A.R.263/08 | ලියාපදිංචි නොකරන ලද MD 90 F 1924852 දරන යතුරු පැදිය | 01 |
| 03. | A.R.360/08 | අංක 149 - 2043 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 04. | A.R.359/08 | අංක 96 - 1017 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 05. | A.R.365/12 | අංක 89- 9691 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 06. | A.R.1192/13 | අංක SGUM 3942 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 07. | A.R.1154/13 | අංක UPTH 5991 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 08. | A.R.582/13 | අංක SPVC 4932 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 09. | A.R.455/14 | අක 107-1737 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 10. | A.R.341/14 | අංක 123-3600 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 11. | A.R.356/14 | අංක WU 3736 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 12. | A.R.755/14 | අක 146 - 5387 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 13. | 90651 | අංක 119 - 0639 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 14. | 92369 | අංක 137 -3044 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 15. | 93386 | අංක 129 - 5238 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 16. | 11643 | ලොන් සිං වර්ගයේ අබලන් යතුරු පැදිය | 01 |
| 17. | 93548 | 1. අංක 109 ශ්‍රී 1101 දරන අබලන් යතුරු පැදිය | 01 |
| | | 2. පයිබර් ඔරු | 01 |
| | | 3. පිහි | 03 |
| 18. | 98912 | අංක SPHN - 8760 දරන අත්ට්‍රැක්ටරය | 01 |
| 19. | 87686 | විවිධ ප්‍රමාණවලින් යුතු යකඩ කුරු කොටස් තොගය | |
| 20. | 90033 | ගැල්වනයිස් බටවලින් සාදන ලද පලංචි කොටස් | |
| 21. | 7627 | ලීටර් 1000 ප්ලාස්ටික් ජලටැංකි | 01 |
| | | ඇලුමිනියම් සින්ක් | 01 |
| 22. | 3027 | යකඩ පීලි කැබලි | 01 |
| 23. | 3031 | යකඩ පීලි කැබලි | 01 |
| 24. | 9420 | අඩි 04 පමණ දිග යකඩ කුරු | 15 |
| 25. | 18860 | විවිධ ප්‍රමාණවලින් යුත් යකඩ කැබලි කොටස් | |
| 26. | 17628 | ගැල්වනයිස් සොකට් | 29 |
| 27. | 14579 | තඹ කම්බි කැබලි | 04 |
| | | යකඩ ජැක් | 10 |
| | | ජී. අයි. කැබලි | 09 |
| 28. | 97077 | ටයිල් කැට 08 බැගින් අඩංගු පෙට්ටි | 05 |
| 29. | 2085 | 1. බදම හැදි | 02 |
| | | 2. මට්ටම් ලී | 02 |
| | | 3. ලඹ | 01 |
| | | 4. බාල්දි | 02 |
| | | 5. විල්බැරෝ | 01 |
| | | 6. ලෙවල් බට | 01 |
| | | 7. සවල් | 01 |
| | | 8. උදලු | 02 |
| | | 9. සිමෙන්ති කොට්ට | 01 |
| 30. | 93683 | ගැල්වනයිස් බට | 05 |
| 31. | 11820 | පොල් ලී | 05 |
| 32. | 2924 | අඩි 01 පමණ දිග යකඩ බට කැබලි | 01 |
| 33. | 17551 | යකඩ කැබලි කොටස් | |
| 34. | A.R.397/14 | යකඩ කොටස් | |
| 35. | A.R.728/13 | ඇග්නේ වර්ගයේ වතුර ගෙඩිය | 01 |
| 36. | A.R.1014/13 | යකඩ කොටස් | |
| 37. | 35808 | විදුලි පංකා | 01 |
| 38. | 9008 | අලවංගු | 01 |
| 39. | A.R.232/14 | අබලන් පාපැදි | 01 |
| 40. | 13648 | මන්න පිහි | 01 |
| 41. | 16602 | හිස් පොහොර කවරය හා මේස පිහි | 01 |
| 42. | A.R.344/14 | යකඩ කොටස් | |
| 43. | 15505 | දරන යකඩ කුරු කොටස් | |
| 44. | 18457 | කුඩා ප්‍රමාණයේ බිම් තරාදිය | 01 |
| | | නයිලෝන් ලනු | 01 |
| 45. | 12750 | කලුපාට අත්බෑගය | 01 |
| 46. | 16475 | යකඩ තහඩු | 01 |
| 47. | A.R.456/14 | අබලන් පා පැදි | 01 |
| 48. | 16312 | දුව ආරක්ෂක තෙල් කෑන් | 02 |
| | | පොලිසැක් උර | |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 49. | 5463 | 1. අබලන් කැමරා | 01 |
| | | 2. විදුලි පන්දම් | 01 |
| 50. | 19597 | සිසිල් වර්ගයේ අබලන් අධිශීතකරණය | 01 |
| 51. | 14193 | ප්ලාස්ටික් බේසම් | 21 |
| 52. | 15761 | පොරව | 01 |
| 53. | 16744 | කලුපාට ටියුබ් | 01 |
| 54. | 14994 | ඉලෙක්ට්‍රොනික් තරාදි | 01 |
| 55. | 18313 | ඇම්පියර් 15 වයර් රෝල් | 01 |
| | | කලු පාට වයර් රෝල් | 01 |
| | | වානේ කම්බි රෝල් | 01 |
| 56. | 7277 | උදලු | 01 |
| 57. | 8911 | සවල් | 01 |
| 58. | 8409 | කැති | 01 |
| 59. | 12127 | අලවංගු | 01 |
| | | පොරව | 01 |
| 60. | 17111 | උදලු | 01 |
| 61. | 14052 | කැති | 01 |
| 62. | 12332 | කැති | 01 |
| 63. | 17901 | උදලු | 01 |
| 64. | 12578 | උදලු | 01 |
| 65. | 17109 | උදලු | 01 |
| 66. | 15779 | පිහි | 01 |
| 67. | 17108 | කැති | 02 |
| 68. | 14054 | පොරව | 01 |
| 69. | 14053 | උදලු | 01 |
| 70. | 4870 | උදලු | 01 |
| 71. | 4260 | උදලු | 01 |
| 72. | 4645 | කැති | 01 |
| 73. | 9094 | බඳම හැඳි | 01 |
| | | මට්ටන් ලී | 01 |
| | | උදලු | 01 |
| | | ලඹ | 01 |
| 74. | 12128 | උදලු | 01 |
| | | අලවංගු | 01 |
| 75. | 98271 | සවල් | 01 |
| | | බකට් | 01 |
| 76. | 14298 | පිහි | 01 |
| | | විදුලි පන්දම් | 01 |
| 77. | 17209 | සවල් | 01 |
| 78. | 14535 | උදලු | 01 |
| 79. | 15780 | උදලු | 01 |
| 80. | 10445 | උදලු | 01 |
| 81. | 14055 | උදලු | 03 |
| 82. | ඒ. ආර්. 585/13 | ජංගම දුරකථන | 01 |
| 83. | 12538 | සී. එෆ්. එල්. විදුලි බල්බ | 01 |
| 84. | 99010 | නිකල් පාට බාර් | 01 |
| 85. | 13068 | ජංගම දුරකථන | 01 |
| 86. | ඒ. ආර්. 283/14 | ජංගම දුරකථන | 01 |
| | | පැදුරු | 01 |
| 87. | 11033 | ජංගම දුරකථන | 01 |
| 88. | 15601 | ජංගම දුරකථන | 01 |
| 89. | 18738 | ජංගම දුරකථන | 01 |
| 90. | 6684 | අව් කණ්නාඩි | 01 |
| | | ජංගම දුරකථන | 01 |
| 91. | 2068 | ජංගම දුරකථන | 02 |
| | | ෆෝන් චාජර් | 03 |
| 92. | 15044 | ජංගම දුරකථන | 01 |
| 93. | 94541 | ප්ලාස්ටික් බේසම් | 01 |
| | | සවල් | 01 |
| 94. | 13330 | උදලු | 01 |
| 95. | 19609 | උදලු | 01 |
| 96. | 6613 | සවල් | 02 |
| 97. | 2702 | විදුලි පන්දම් | 01 |
| | | කටර් අඩු | 01 |
| | | අබලන් පා පැදි | 01 |
| 98. | 22043 | පැදුරු | 01 |
| 99. | 57482 | නිල් පාට ප්ලාස්ටික් ලොකු බූලි | 01 |
| | | නිල් පාට ප්ලාස්ටික් කුඩා බූලි | 01 |
| 100. | 5273 | පැදුරු | 01 |
| 101. | 21917 | පැදුරු | 01 |
| 102. | 7282 | පැදුරු | 01 |
| 103. | 22604 | පනිට්ටු | 04 |
| 104. | 21020 | පනිට්ටු | 01 |
| 105. | 21022 | ඇලුමිනියම් තල | 01 |
| 106. | 88563 | කුලු ගෙඩි | 01 |
| | | අලවංගු | 01 |
| 107. | 3317 | පොරව | 01 |
| 108. | 96430 | කුලු ගෙඩි | 02 |
| 109. | අංක රහිත | ප්ලාස්ටික් බූලි තොගය | |
| 110. | අංක රහිත | ගැලුම් 45 යකඩ බැරල් | 18 |
| 111. | අංක රහිත | ටකරන් තහඩු | 03 |
| 112. | අංක රහිත | තෙල් මනින උපකරණ | 02 |
| 113. | අංක රහිත | සවල් | 05 |
| 114. | අංක රහිත | ලොකු ඇලුමිනියම් හට්ටි | 01 |
| 115. | අංක රහිත | බෝතල් තොගයක් | |
| 116. | අංක රහිත | දිරාපත් වූ දව තොගයක් | |
| 117. | අංක රහිත | වැලි කියුබ් | 40 |
| 118. | අංක රහිත | පස් කියුබ් | 28 |

08-10

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

ප්‍රා. ලේ./මීග/01/12/රා රේන්ද 2016.

**මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය රා රේන්ද විකිණීම - 2016**

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට පහත දැක්වෙන තැබෑරුම්වල හා විදෙස් මත්පැන් හල සඳහා 2016 ජනවාරි මස 01 වැනි දින සිට 2016 දෙසැම්බර් 31 වැනි දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත් 2015.09.18 වැනි දින පෙ.ව. 10.30 දක්වා මවිසින් භාරගනු ලැබේ.

2. රා රේන්ද හා විදෙස් මත්පැන් හල ලබා ගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය කුවිතාන්සිය ද, ප්‍රකාශිත රා රේන්ද කොන්දේසිය පරිදි ලබාගත් වත්කම් සහතිකය ද ඊට අදාළ ඔප්පුවේ ඡායා පිටපතක් ද, සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා, එහි වම් පස ඉහළ කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ අංකය සහ නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි උපලේඛනයේ දැක්වෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් මීගමුව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

3. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන 2015.09.18 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

5. අදළ හා අත්‍යවශ්‍ය කරුණු සම්පූර්ණ කොට නොමැති අයදුම් පත්‍රයක් හෝ අයදුම්පත් සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මා සතු වේ.

6. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් හා විදේශ මත්පැන් හල නැවත විකිණීම 2015.11.16 වැනි දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම මෙම ගැසට් පත්‍රයේ දෙවන ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

7. "තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා" යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණන දින ප. ව. 3.00 ට පෙර මා විසින් නියම කරනු ලබන මාසික රේන්ද මුදල මෙන් දෙගුණයකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

8. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

9. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

ඒ. කේ. ආර්. අලවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
මීගමුව.

2015 ජූලි මස 14 වැනි දින,
මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

| තැබෑරුම් අංකය සහ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තැබෑරුම් පිහිටුවිය යුතු කොට්ඨාසය | තැබෑරුම් විවෘත කරන වේලාව සහ තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| අංක 10 - සෙත්තපාඩුව | මීගමුව | සෙත්තපාඩුව පමණක් | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 5,000 | 2015.09.18 දින පෙ.ව. 10.30 දක්වා |
| අංක 11 - බසියවත්ත | එම | බසියවත්ත පමණක් | එම | එම | එම |
| අංක 12 - පිටිපන | එම | පිටිපන පමණක් | එම | එම | එම |
| අංක 15 - කුරණ | එම | කුරණ පමණක් | එම | එම | එම |
| අංක 16 - කාමෝච්චෝඩය | එම | කාමෝච්චෝඩය පමණක් | එම | එම | එම |
| අංක 17 - උඩයාර්තෝප්පුව | එම | උඩයාර්තෝප්පුව පමණක් | එම | එම | එම |
| අංක 18 - කුඩා පාඩුව | එම | කුඩාපාඩුව පමණක් | එම | 1,000 | එම |
| අංක 19 - දළුපත | එම | දළුපත පමණක් | එම | 5,000 | එම |
| අංක 20 - පෝරුතොට | එම | පෝරුතොට පමණක් | එම | 3,000 | එම |
| අංක 21 - කොච්චිකඩේ | එම | කොච්චිකඩේ ගමේ පමණක් | එම | 3,000 | එම |
| අංක 22 - පළඟතුරය | එම | පළඟතුරය පමණක් | එම | 1,500 | එම |
| අංක 02 - ග්‍රීන් බාර්(විදේස් මත්පැන් හල) | එම | අංක 8 කොට්ඨාසයේ කුණ්ඩන්විල පමණක් | එම | 3,000 | එම |

08-08

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම - 2016 වර්ෂය

බලංගොඩ අංක 01 - රා තැබෑරුම

2016 ජනවාරි මස 01 වැනි දින සිට 2016 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාල සීමාව තුළ මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන ප්‍රදේශයන්හි පැසුණු රා සිල්ලරට විකිණීම පිණිස ටෙන්ඩර් කැඳවනු ලැබේ.

මෙහි පහත සඳහන් කොන්දේසිවලට අනුකූල විය යුතුයි :-

(i) 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි අනුව; හා
(ii) සුරා බදු නිවේදනයෙහි දැක්වෙන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි ම බලපාන කරුණු කොන්දේසි මාලාවට යටත්ය.

02. සෑම ටෙන්ඩරයක් වෙනුවෙන් ම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ලංකා බැංකු ශාඛාවකින් මුදල් තැන්පත් කළ බවට ලදුපතක් ටෙන්ඩරයට අමුණා එවිය යුතු ය. පෝර්ම ගාස්තුව රු. 1,500 කි.

03. ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකින් ද, කොළඹ සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන් ද, ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍රයක ලියන ලද ටෙන්ඩර් පත්‍රය, කවරයක බහා සීල් තබා වම් උඩ කෙළවරේ මුදුණේ කුමන තැබෑරුමක් සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩරයක් ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතු ය. ටෙන්ඩර් වැසීමට කාලය ඉකුත් වීමට කලින් "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, බලංගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් බලංගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

04. සෑම ටෙන්ඩර්කරුවෙක් ම තමාගේ නමින් ම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

05. එක් අයෙකුට එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩරයකට වඩා එවිය නොහැක. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට වැඩි පිරිසක් විසින් සාමූහිකව ටෙන්ඩර් ඉදිරිපත් කළ නොහැක.

06. ටෙන්ඩර් කරන මුදල් ඉලක්කමෙන් සහ අකුරෙන් සඳහන් කළ යුතු ය. ටෙන්ඩරයේ කරන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යොදා සහතික කළ යුතු ය. සෑම ටෙන්ඩරයක්ම සාක්ෂිකරුවන් දෙදෙනෙකු විසින් ද අත්සන් කළ යුතු ය. මෙම අවශ්‍යතාවයන් අනුකූල නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කළ හැකිය.

07. ජයග්‍රාහී ටෙන්ඩර්කරු මිලදී ගත් තැනැත්තා හැටියට ප්‍රකාශ කළ විගසින් රේන්දය විකිණීමේ කොන්දේසියට අත්සන් තබා බලංගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරන ලද මුදල ඇප වශයෙන් තැන්පත් කළ යුතු ය.

08. 2015.09.07 වැනි දින පෙරවරු 10.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. සෑම ටෙන්ඩර්කරුවෙක්ම එහි නියමිත වේලාවට බලංගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

09. 2015.09.07 වැනි දින ටෙන්ඩර් විකිණීම අසාර්ථක වුවහොත් 2015.10.30 වැනි දින පෙ. ව. 10.30 දක්වා නැවත විකිණීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

10. කිසිදු හේතුවක් නොදන්වා කිසියම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ ස්වකීය අභිමතය පරිදි ප්‍රතික්ෂේප කිරීමේ බලය බලංගොඩ ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

11. 2015 වර්ෂය සඳහා දැනට තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථානය ලබා ගත හැකිදැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුලින් ගොඩනැගිලි සොයාගත යුතු අතර, එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගත යුතු වේ. ගොඩනැගිලි සොයා දීමට බලපත්‍ර අධිකාරි බැඳී නොමැති බව ද සැලකිය යුතුය.

12. වැඩි විස්තර බලංගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් විමසා දැන ගත යුතු ය.

චම්පික නිරෝෂ් ධර්මපාල,
ප්‍රාදේශීය ලේකම්,
බලංගොඩ.

2015 ජූලි මස 10 වැනි දින,
බලංගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාසය* | *පිහිටි ස්ථානය* | *තැබෑරුම විවෘත කර තැබිය හැකි වේලාවන්* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|
| අංක 01<br>බලංගොඩ<br>රා තැබෑරුම | බලංගොඩ | බලංගොඩ නගර සභා සීමාව තුළ | පෙ.ව. 11.00 සිට<br>ප.ව. 2.00 දක්වා<br>සහ<br>ප.ව. 5.00 සිට<br>ප.ව. 8.00 දක්වා | 2015.09.07 වැනි දින<br>පෙ.ව. 10.30 |

08-05

---

**ජා ඇල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය**

2016 ජනවාරි මස 01 වැනි දින සිට 2016 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2016 ජනවාරි මස 01 වැනි දින සිට 2016 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුණේ වම් කෙළවරෙහි "අංක.................... දරන............................ රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2015.09.17 වැනි දින පෙ.ව. 10.30 ට පෙර ජා ඇල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර ජා ඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2015.09.17 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ජා ඇල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2015.11.13 දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ජා ඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

දුරකථන අංකය : 011- 2236428.

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
ජා ඇල.

මගේ අංකය : ජා/1/7/02/06.
2015 ජූලි මස 06 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
ජා-ඇල.

**උපලේඛනය**

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රුපියල්)* |
|---|---|---|---|---|
| 01 | ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කඳාන | 2015.09.17 පෙ.ව. 10.30 | 1,500.00 |
| 02 | එම | වැලිගම්පිටිය | එම | 1,500.00 |
| 03 | එම | කණුවන | එම | 4,000.00 |
| 04 | එම | මඩමවත්ත ඒකල | එම | 5,000.00 |
| 05 | එම | දඬුගම | එම | 1,000.00 |

08-04

---

**ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම - 2016 වර්ෂය**

2016 වර්ෂයේ ජනවාරි 01 වැනි දින සිට 2016 දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිළ දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2015.08.26 වැනි දින පෙ.ව. 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්දය ලබාගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් වත්කම් සහතිකයක් ද, සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා කවරයේ වම් පස ඉහළ කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන රා තැබෑරුමේ

අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් බාරගැනීමේ අවසන් වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන් සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

04. ටෙන්ඩර් බාරගන්නා අවසාන දිනය වන 2015.08.26 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකළ ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ලුණුගල ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2015.10.20 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිලදීගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණූ දින ප.ව. 2.00 ට පෙර ලුණුගල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක මුදල් කොටසට වැඩි කොටසකට ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි වේ.

ඩී. එම්. එල්. එච්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගල.

2015 ජූලි මස 16 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

*2016 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තු - ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - 2016.01.01 වැනි දින සිට 2016.12.31 වැනි දින දක්වා*

| *අනුක්‍රමික අංකය* | *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කළ යුතු වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* | *ටෙන්ඩර් තැන්පත්* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය සහ වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01 | ලුණුගල අංක 02 | ලුණුගල | ලුණුගල ප්‍රාදේශීය සභාවේ කොට්ඨාස අංක 02 හි වරිපනම් අංක 219 දරන කුරුවිකුඹුරු වත්ත | පෙ.ව. 11.00ට<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | රුපියල් 5,000 | 2015.08.26 පෙ.ව. 10.30 |

මහදෝව වත්තේ සීමාව තුළ 2016 වර්ෂය සඳහා රා කැත්ටින් බලපත්‍ර අළුත් කිරීමට එම වත්තේ වතු අධිකාරි විසින් ඔහුගේ නිර්දේශය 2015.08.20 වැනි දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලුණුගල ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතු ය.

08-84

---

**2016 වර්ෂය සඳහා කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම**

2016 ජනවාරි මස 01 වැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිලට ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ සුරාබදු කොමසාරිස් විසින් පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2015 අගෝස්තු මස 31 වැනි දින පෙ. ව. 10.30 දක්වා කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

රා රේන්ද මිල දී ගැනීමට ඉදිරිපත් වන අය නියමිත ටෙන්ඩර් ආකෘතිය නිසි පරිදි සම්පූර්ණ කොට මෙහි පහත දැක්වෙන උපලේඛනයෙන් නියමිත කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවා ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් සරප් වෙතින් ලබාගත් කුවිතාන්සියක් ද ඉහත දැක්වෙන ගැසට් නිවේදනයේ වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව කවරයක බහා එය මුද්‍රා තබා එහි මුදුණේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන රා තැබෑරුමේ අංකය ද, නම ද පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබීමට සැලැස්විය යුතුය. නියමිත ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකිය.

ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩරයක් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ටෙන්ඩර් භාර ගන්නා අවසන් දිනය 2015 අගෝස්තු මස 31 වැනි දින පෙ. ව. 10.30 තෙක් පමණි. සියලුම ටෙන්ඩර්කරුවන් මෙදින එම වේලාවට මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

කිසිම කරුණු දැනුම්දීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් සතු වේ.

තනි වරප්‍රසාද ලබා ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කරන ලද දින පස්වරු 2.00 ට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂක ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

2016 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම් ඇති ස්ථාන ලබාදීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2016 වර්ෂය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් වෙනත් ස්ථානයක යෝග්‍යතාවය පිළිබඳ ටෙන්ඩර් ප්‍රදානය කළ දින සිට දින 30 ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා කුරුණෑගල ප්‍රාදේශීය ලේකම්ගෙන් අනුමැතිය ලබාගත යුතුය.

2015 අගෝස්තු මස 31 වැනි දින රේන්ද විකිණීමෙහි ලා සතුටුදායක ඉල්ලීමක් නොතිබුණහොත් 2015 ඔක්තෝබර් මස 23 වැනි දින පෙ. ව. 10.30 ට නැවත රේන්දය විකිණීම මෙම ස්ථානයේ දී ම පවත්වනු ලැබේ.

වැඩි විස්තර සඳහා අවශ්‍ය වේ නම් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඊ. එම්. එම්. එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
කුරුණෑගල.

2015 ජූලි මස 20 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

**කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම - 2016**

| *අංකය හා නම* | *පත්තුව* | *තැබෑරුම විවෘත කළ යුතු ප්‍රදේශය* | *ටෙන්ඩර් තැන්පත් මුදල* | *ටෙන්ඩර් වසන දිනය හා වේලාව* | *තැබෑරුම විවෘත කළයුතු වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* |
|---|---|---|---|---|---|---|
| අංක 02 කුරුණෑගල | වැඋඩ විල්ලි හත්පත්තුව | නාගරික කොට්ඨාසය අංක 01, 09, 10, 11, 12 | රු. 3,000 | 2015 අගෝස්තු 31 දින පෙ. ව. 10.30 දක්වා | පෙ.ව. 11.00 සහ ප. ව. 5.00 | ප. ව. 2.00 සහ ප. ව. 8.00 |

08-254

**මොණරාගල දිස්ත්‍රික්කය - බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2016 වර්ෂය

2016 ජනවාරි මස 01 වැනි දින සිට 2016 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මොණරාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ පූර්ණ වරප්‍රසාදය මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත් ව 2015 අගෝස්තු මස 27 වැනි දින පෙ. ව. 10.30 දක්වා, ම විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ. මෙම රේන්දය නැවත විකිණීම 2015 ඔක්තෝබර් මස 21 වැනි දින පෙ.ව. 10.30 ට සිදු වේ.

02. රා රේන්දය ලබා ගැනීමට ඉදිරිපත් වන අයට ටෙන්ඩර්පත් ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි ය. නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර, මෙහි පහත ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් කුවිතාන්සියක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් ඉල්ලුම් කරන ලද තැබෑරුමෙහි අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර්පත් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් හෝ මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය. එමෙන් ම ටෙන්ඩර්කරුගේ ඉඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ද ඉදිරිපත් කළ යුතු වේ.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්පත්වල කරන ලද සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුවන්ගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

04. ටෙන්ඩර් විවෘත කරන දිනය වන 2015 අගෝස්තු මස 27 වැනි දින පෙ. ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන්ට මෙම කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය හැක. ටෙන්ඩර්පත් නිකුත් කිරීම 2015 අගෝස්තු මස 27 වැනි දින පෙ. ව. 10.30 ට අවසන් වේ.

05. යම්කිසි කරුණක් සටහන් නොකරන ලද ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කරන ලද දිනය, එනම් රේන්ද විකුණූ දින ප. ව. 2.00 ට පෙර බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මාස දෙකක රේන්ද මුදල් කොටසකට නොවැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි වේ.

කසුන් එස්. කේ. වැල්ලහේවා,
ප්‍රාදේශීය ලේකම්,
බඩල්කුඹුර.

2015 ජූලි මස 17 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

***උපලේඛනය***

***බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය***

*2016 වර්ෂය සඳහා අනුමත රා තැබෑරුම් ලැයිස්තුව - මොණරාගල දිස්ත්‍රික්කය*

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ග්‍රාමය* | *තැබෑරුම විවෘත කර තබන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|
| 01. | මොණරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පල්ලේවෙරාදොල | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා නැවත ප. ව. 4.00 සිට ප. ව. 8.00 දක්වා | 500.00 | 2015.08.27 දින පෙ. ව. 10.30 |

08-87

# රජයේ නොවන දැන්වීම්

## පුද්ගලික සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටත් කරනු ලබන දැන්වීම

සමාගමේ නම : අයිබෙක්ස් මැනේජ්මන්ට් සර්විසස් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : PV 72846
ලියාපදිංචි දිනය : වර්ෂ 2011 ක් වූ මාර්තු මස 10 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 33, මල්ලිකා ලේන්, කොළඹ 06

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

හරේෂ් මුරලිදර් හර්ජානි,
අධ්‍යක්ෂක.

08-16

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතට අනුව, 2015 ජුනි මස 26 වැනි දින සිදු කරන ලද පහත සඳහන් සංස්ථාගත කිරීම මේ මගින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : රාමා කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 106586
ලියාපදිංචි ලිපිනය : ලෙවල් 10, සෙලින්කෝ හවුස් අංක 69, ජනාධිපති මාවත, කොළඹ 01

ජේසී සහ සමාගම,
සමාගම් ලේකම්වරු.

අංක 9/5, තම්බයියා ඇවෙනිව්,
කොළඹ 07.

08-46

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතට අනුව, 2015 ජුනි මස 26 වැනි දින සිදු කරන ලද පහත සඳහන් සංස්ථාගත කිරීම මේ මගින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : මිලේනියම් මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 106471
ලියාපදිංචි ලිපිනය : අංක 323, යූනියන් පෙදෙස, කොළඹ 2

ජේසී සහ සමාගම,
සමාගම් ලේකම්වරු.

අංක 9/5, තම්බයියා ඇවෙනිව්,
කොළඹ 07.

08-47

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

කඩවත, ගෝනහේන, කෙසෙල්වත්ත, අංක 428/12/2/එෆ් හි පදිංචි මනතුංග පුෂ්පා රංජනී සිල්වා වන මම, එම ලිපිනයෙහි ම පදිංචිව සිට දැනට විදේශගතව සිටින රොෂාන් සමරසූරිය යන අයගේ ඇටෝර්නි බලකාරිය ලෙස මා පත් කරන ලද ඇල්පිටියගේ මධුභානි කෞශල්‍යා ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද අංක 02 සහ 2011.12.05 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවත්, එය තවදුරටත් වලංගු සහ බලසහිත නොවන බවත්, මෙයින් ප්‍රකාශ කර සිටිමි.

මනතුංග පුෂ්පා රංජනී සිල්වා.

08-91

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව යුනික් ලංකා එනර්ජි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2015 ජුනි මස 30 වැනි දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : යුනික් ලංකා එනර්ජි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 106667
ලියාපදිංචි කාර්යාලය : අංක 125, හෙට්ටියාවත්ත, මුල්ලේරියාව නව නගරය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

යුනික් ලංකා එනර්ජි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

08-94

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම 2015 ජුනි මස 17 වැනි දින ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : සව්සෙවන කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 106382
ලියාපදිංචි කාර්යාලය : අංක 55, 5 වැනි පටමුග, නාවල.

එස්ජේ කෝර්පරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

4 වැනි මහල, අංක 2,
කාසල් පටුමග, කොළඹ 4.

08-96

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ

